








2026-2027

# මිට්සුබිෂි ආසියාතික දරුවන්ගේ ඉනික්කි ෆෙස්ටා

## ඔබේ විස්තරාත්මක දෛනික දින පොත (ඉනික්කි) සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමට ආරාධනා

### ඔබේ දෛනික ජීවිතය විස්තර කෙරෙන දිනපොත් තුලින් ඔබ පිලිබඳ අවබෝධයක් ආසියාතික මිතුරන්ට ලබා දෙන්න.

**මෙම චිත්‍ර තරගයෙන් නිර්මාණය කරන විස්තරාත්මක දින පොත් තුලින් ලෝකයේ දරුවන් සඳහා ආසියානු ළමයින්ගේ දෛනික ජීවිතය පිලිබඳ දැන ගැනීමට අවස්ථාවක් සලසා දෙයි. ආසියාවේ විවිධ රටවල් හා කලාප 24ක දරුවන් සඳහා "මට ආසියාවේ සිටින සියලු දෙනා සමඟ බෙදා ගැනීමට අවශ්‍ය මගේ ජීවිතය" තේමා කර ගනිමින් විස්තරාත්මක දින පොත් නිර්මාණය කිරීමට අප ආරාධනා කරමු. ඔබගේ දෛනික ජීවිතයේ දින තුනක් පිළිබිඹු කරමින් නිර්මාණය කරන විස්තරාත්මක දින පොත් ප්‍රදර්ශනය සඳහා ඔබ සහභාගී නොවන්නේ ඇයි? ඔබගේ ජීවිතයේ සතුටුදායක අවස්ථාවක් පිලිබඳව ආසියාතික මිතුරන්ට දැන ගැනීමට සලස්වන්න.**

### ඇතුළත්වීමේ කොන්දේසි

**ක්‍රමය**
සෑම චිත්‍ර නිර්මාණයක්ම ඔබේ දෛනික ජීවිතයේ සිදුවීමක් විය යුතු අතර එය චිත්‍රයට නගා ඒ පිළිබද කෙටි විස්තරයක් ද සමන්විය යුතුය.(මේ සදහා සායම්, පාට පැන්සල්,ක්‍රෙයෝන්, හා වෙනත් මාධ්‍යක් සමග චිත්‍ර අදින කඩදාසි භාවිතා කළ හැක)

**ප්‍රමාණය**
මි.මී. 297 x මි.මී. 210 (A4 ප්‍රමාණය) චිත්‍රය ඇඳීමේදි කඩදාසිය දිග අතට භාවිතා කළ යුතු අතර සම්පූර්ණ කඩදාසියෙන් 2/3ක් චිත්‍රයද 1/3ක් විස්තරය සදහාද වෙන් කළ යුතුය. විස්තරය පේළි 03 සිට 05 අතර විය යුතුය.

**වයස් සීමාව**
අවුරුදු 06ත් 12ත් අතර ළමුන් සදහා

**තේමාව**
"ආසියාවේ සිටින සියලු දෙනා සමඟ බෙදා ගැනීමට අවශ්‍ය මගේ ජීවිතය" තම ආසියානු මිතුරන්ට දැන ගැනිමට අවශ්‍ය ඔවුන්ගේ දෛනික ජීවිතයේ ළමයින් කළ,දුටු,අත්විදින හෝ මනසේ තබා ගත් දේ විස්තර කල හැකිය.(සොබා දහම හා දේශගුණය,කැමතිම ක්‍රීඩාව, පවුල, යහළුවන්, පාසල් ජීවිතය, දේශීය උත්සව, සංස්කෘතික අංග ආදිය)

**අයදුම්පත් කාල සීමාව (දේශීය)**
2026 අගෝස්තු මස 15 සිට 2026 ඔක්තෝම්බර් මස 31 දක්වා

Picture
Essay

**ජයග්‍රාහකයින් නිවේදනය**
දේශිය 2026 නොවැම්බර්, ආසියාතික 2027 මැයි

**ත්‍යාග**
ආසියාතික - අති විශිෂ්ටතම ත්‍යාගය (එක් රටකින් එක් ජයග්‍රාහකයෙකු බැගින්)
ත්‍යාගයේ එක් කොටසක් ලෙස සෑම විශිෂ්ටතම ත්‍යාගලභියෙකුට ජපානයේ පැවැත්වෙන ත්‍යාග ප්‍රදානෝත්සවයට සහ සංස්කෘතික වැඩසටහනට ආරාධනා කෙරේ .
මිට්සුබිෂි පොදු කටයුතු කමිටු ත්‍යාග (එක් රටකින් එක් ජයග්‍රාහකයෙකු බැගින්)
ආසියා ශාන්තිකර කලාපයේ යුනෙස්කෝ සමාජ හා සංගම් සඳහා වූ ෆෙඩරේෂණ ත්‍යාගය (එක් රටකින් එක් ජයග්‍රාහකයෙකු බැගින් )
ජපානයේ යුනෙස්කෝ සමාජ හා සංගම් සඳහා වූ ෆෙඩරේෂණ ත්‍යාගය (එක් රටකින් එක් ජයග්‍රාහකයෙකු බැගින්)

වැඩි විස්තර සදහා 011 217 7002 අමතන්න. සම්පූර්ණ කරන ලද චිත්‍ර නිර්මාණ ශ්‍රී ලංකා ජාතික යුනෙස්කෝ කොමිෂන් සභාව, 5 වන මහළ, අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය බත්තරමුල්ල යන ලිපිනයට එවන්න.

සහභාගී වන රාජ්‍යන් හා කලාප බංගලාදේශය, භූතානය,බෲනායි, දරුසලාම්, කාම්බෝජය ,චීනය ,ඉන්දියා ,ඉන්දුනීසියාව ,කසකස්තානය, ප්‍රජාතන්ත්‍රවාදී කොරියානු සමුහාණ්ඩුව, ලාඕසය, මැලේසියාව, මාලදිවයින, මොන්ගෝලියාව, මියන්මාරය, නේපාලය, පකිස්තානය, පිලිපීනය, සිංගප්පුරුව, ශ්‍රී ලංකාව, චීන තායිපේ, තායිලන්තය, ටිමෝරය, වියෙට්නාමය හා ජපානය

සංවිධානය මිට්සුබිෂි පොදු කටයුතු කමිටුව/ආසියා ශාන්තිකර කලාපයේ යුනෙස්කෝ සමාජ හා සංගම් සදහා වූ ෆෙඩරේෂනය/ජපානයේ යුනෙස්කෝ සංගම් සදහා වූ ජාතික ෆෙඩරේෂනය

දේශීය සංවිධානය
ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව

සහාය
යුනෙස්කෝ සංවිධානය

මිට්සුබිෂි ආසියානු ළමුන්ගේ "ඉනික්කි ෆෙස්ටා"සදහා මිට්සුබිෂි ආයතනය අනුග්‍රහය දක්වයි.